මංජුක පුෂ්පකුමාර
ර/ ඇහැ /ධර්මපාල ම.වි

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

## කාර්ය පත්‍රිකාව - 25 වන සතිය

- **නිපුණතාව 0.2 - නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිත කරයි**
- **නිපුණතා මට්ටම 2.3 - දේශීය නර්තන සම්ප්‍රදාය හා සබැඳී තාල ලක්ෂණ පිළිබඳව විග්‍රහ කරයි.**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) තාලය පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් කළ පඬිවරුන් වන්නේ

(i) අමරසිංහ ආචාර්යයන්, අභිනව ගුප්ත, සාරංග දේව පඬිතුමා
(ii) අමරදේවයන්, අභිනව ගුප්ත, නන්දිකේශ්වරයන්
(iii) සාගර පලංසූරිය, අමරසිංහ ආචාර්යයන්, අමරදේවයන්
(iv) එදිරිවීර සරච්චන්ද්‍රයන්, සාරංග දේව පඬිතුමා, අභිනව ගුප්ත
(v) සාරංග දේව පඬිතුමා, අභිනව ගුප්ත, අමරදේවයන්

(02) තාලය පිළිබඳ අර්ථකථනය කරමින් ''අමරසිංහ ආචාර්යයන් හා සාරංග දේව පඬිතුමා'' විසින් රචනා කර ඇති කෘති දෙක වන්නේ

(i) අභිනව භාරතී හා අමරකෝෂයයි
(ii) අභිනව දර්පණය හා සංගීත රත්නාකරයයි
(iii) අමරකෝෂය හා සංගීත රත්නාකරයයි
(iv) නෘත්‍ය රත්නාකරය හා හෙළ ගී මඟයි
(v) සංගීත රත්නාකරය හා නෘත්‍ය රත්නාකරයයි

(03) පාරම්පරික ශිල්පීය තාලය හැඳින්වීමට භාවිතා කළ නාම වන්නේ

(i) අඩ තිත, මූලාන්ත තිත, මධ්‍ය තිත, මහ තනි තිත
(ii) සුළු තනි තිත, මැදුම් තනි තිත, මහ තනි තිත, මූලාන්ත තිත
(iii) සුළු තනිතිත, මැදුම් තනි තිත, මධ්‍ය තිත, අඩ තිත
(iv) අඩ තිත, දෙතිත, මහ තනි තිත, මූලාන්ත තිත
(v) අඩ තිත, මධ්‍ය තිත, තාල තිත, මූලාන්ත තිත

(04) තාල පද්ධතිය පිළිබඳව ලියැවී ඇති ''සිංහල නාට්‍ය ප්‍රදීපය හා නෘත්‍ය රත්නාකරය'' ග්‍රන්ථය රචනා කළ ශිල්පීන් වනුයේ

(i) ජේ ඊ. සේදරමන් මහතා හා වින්සන්ට් සෝමපාල මහතා

(ii) ජේ. ඊ. සේදරමන් මහතා හා ජේ. ඊ.ගුණසේන මහතා

(iii) ජේ. සී. මාලගම්මන මහතා හා ජේ. ඊ සේදරමන් මහතා

(iv) ගුණසේන රාජපක්ෂ මහතා හා වින්සන්ට් සෝමපාල මහතා

(v) සරත් විජේවර්ධන මහතා හා විල්සන් අල්ගම මහතා

(05) තිත් රූප 32ක් හඳුන්වා දීම එම 32න් 07ක් අවනද්ධ තාල වාදනයට අහිතකර බව දක්වා තිබීම තාලේ පිළිබඳ වැදගත් නියමයන් කීපයක් හඳුන්වා දී ඇති ග්‍රන්ථය වනුයේ

(i) ජේ. ඊ. සේදරමන් මහතාගේ නෘත්‍ය රත්නාකරය

(ii) ජේ. ඊ. ගුණසේන මහතාගේ සිංහල නාට්‍ය ප්‍රදීපය

(iii) ජේ. සී.මාලගම්මන මහතාගේ තාල ශාස්ත්‍රය

(iv) වින්සන්ට් සෝමපාල මහතාගේ තාල ඥානය

(v) ඩබ්.බී. මකුලොලුව මහතාගේ හෙළ ගී මග

**හිස්තැන් පුරවන්න**

(01) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මිනිසා තාල තැබීමට අනුගමනය කළ මූලික උපක්‍රමය වනුයේ ............................................................ තැළීමයි.

(02) පෙරදිග මතයට අනුව තාලයන්ගේ පිහිටීම ............................................ නම් වෙයි.

(03) අපරදිග ලෝකයේ නිපදවන ලද පළමු තාල වාද්‍ය භාණ්ඩය ............................................................ නමින් හඳුන්වනු ලැබේ.

(04) තාල ප්‍රතිෂ්ඨාකරණේ ඉති තාල තාල වල පිහිටුවීම හෙවත් ප්‍රතිෂ්ඨාකරණය තාල යනුවෙන් ............................................................ ආචාර්යයන්ගේ නම් කෘතියෙහි දක්වා ඇත.

(05) තාල පද්ධතිය පිළිබඳ ලියවී ඇති සංගීත රත්නාකරය ............................................................ මහතා විසින් රචනා කර ඇත.

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

(01) තාලය පිළිබඳ සඳහන් වී ඇති විවිධ අර්ථකථන පිළිබඳ විග්‍රහයක් කරන්න.

(02) දේශීය තාල පද්ධතියේ විකාශය පිළිබඳව විග්‍රහ කරන්න.

(03) නර්තනය පාසල් විෂය මාලාවට ඇතුළත් වීමත් සමග දේශීය තාල පද්ධතියේ සිදුවූ වෙනස්කම් විස්තර කරන්න.